ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: 01/15/12/22

## මාධ්‍ය නිවේදනය

2022.10.27 වන දින කොළඹ රාජකීය විදුහලේ ගුරුවරයෙකු විසින් පාසල් සිසුවෙකු හට විනය සම්බන්ධව ශාරීරිකව දඬුවම් ලබාදුන් බවට පැමිණිල්ලක් ගොනු කරන ලදි (පැමිණිලි අංකය - HRC/HO/4172/22). 2022.11.14 වන දින ඒ සම්බන්ධව පැවති පරීක්ෂණයේදී සිසුවාගේ විනය පාලනය කිරීමේ චේතනාවෙන් දඬුවම් කලබව හෙලිදරව් විය. ඒ අනුව මින් ඉදිරියට එම පාසලේ කිසිම ආකාරයකින් විනය හැසිරවීමේදී සිසුන්ට ශාරීරික හිංසනය හෝ මානසික හිංසනයන් සිදු නොවීමට  වග බලා ගත යුතු බව විදුහල්පති වෙත නිර්දේශ කල අතර එහි ප්‍රථම පියවර ලෙස අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛ 12/2016 පිළිබඳව සියළු ගුරුභවතුන් දැනුවත් කිරීමට විදුහල්පති වෙත නිර්දේශ කරන ලදි.

නිර්දේශයට අදාලව විදුහල්පති විසින් 12/2016 චක්‍රලේඛය හා ඒ පිලිබඳ දැනුවත් කිරීමේ  ලිපිය සම්බන්ධයෙන් පාසලේ සියළු ගුරුවරුන් දැනුවත් කර එකී විධිවිධාන වලට යටත්ව කටයුතු කිරීමට උපදෙස් ලබාදුන් බව  2022.12.01 දිනැති වාර් තාව මගින් කොමිෂන් සභාවට දැනුම් දී ඇත.

මාධ්‍ය ප්‍රකාශක,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2022 දෙසැම්බර් 15